# ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාපිත කරමින් ගරු කොබ්බෑකඩුව මහතා කළ දේශනය

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සංස්ථාවක් වීමේ උත්සවයට සහභාගිවීමට පුළුවන්වීම ගැන මම සතුටු වෙමි. වාසනාවකට මෙන් ආයතනයේ ප්‍රථම පුහුණුවීමේ පාඨමාලාව ඇරඹීමත් අදට යෙදී ඇත.

මෙබඳු ආයතනයක් පිහිටුවීම ගැන අදහස ඇතිවූයේ වර්ෂ 10 කට ප්‍රථම අග්නිදිග ආසියාතික ප්‍රදේශ සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයක් පිහිටුවීමට යෝජනාවක් ඉදිරිපත් වූ පසුවය. මෙවැනි ආයතනයකින් අපේක්ෂා කල කාර්යයන් මෙසේය.

අ) අසල්වැසි රටවල් සම්බන්ධ කර ගෙන ගොවිජන ව්‍යුහයට අදළ ප්‍රශ්න පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.

ආ) ගොවිජන ප්‍රතිසංස්කරණ සහ අදළ විෂයයන් සම්බන්ධයෙන් පුහුණුවීමේ පහසුකම් සැපයීම.

ඇ) ගොවිජන ප්‍රශ්න සහ ඊට සම්බන්ධ විස්තර එක්රැස් කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

මෙම යෝජිත ආයතනය තමන්ගේ රටෙහි පිහිටුවන ලෙස රටවල් කිහිපයක් විසින්ම ලෝක ආහාර සංවිධානයට ඉල්ලුම් කර තිබුණි. ලංකාණ්ඩුව මගින් ද එවැනි ඉල්ලීමක් කරන ලදි. ලෝක ආහාර සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙල සහ ලංකාණ්ඩුව අතර පැවති සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් 1969 වර්ෂයේ දී මෙම ආයතනය ලංකාවේ පිහිටුවීමට තීරණය විය.

ලෝක ආහාර සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල සහ ලංකාණ්ඩුව අතර අත්සන් කළ ගිවිසුම අනුව මුල් පස් වර්ෂය තුළ ලෝක ආහාර සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල විසින් ආයතනය පවත්වාගෙන යාමට ආධාර කරනු ඇත. පස් වර්ෂය අවසානයෙහි මෙය සම්පූර්ණ වගකීමෙන් යුතු ජාතික ආයතනයක් බවට පෙරලෙනු ඇත. විශේෂඥ නිලධාරීන්ගේ වේතන, විදේශීය පුහුණුවීමේ හා උපකරණවල වියදම් සඳහා ලෝක ආහාර සංවිධානය / එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල විසින් රුපියල් ලක්ෂ පනස් පහක පමණ ආධාර මුදලක් වෙන් කරනු ඇත. ලංකාණ්ඩුව විසින් ආයතනයේ ඉඩම සහ ගොඩනැගිලි ද, දේශීය නිලධාරීන්ගේ සේවාව ද, වෙනත් පහසුකම් ද සපයනු ඇත. මෙම ආයතනය ඉදිරි කාලය තුළ එය පිහිටුවා ඇති රටෙහි පමණක් නොව, මුළු ආසියාතික රටවල අවශ්‍යතාවන් සපුරාලනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සුදුසු ස්ථානයක් නොමැතිවීම, නිලධාරීන්ගේ වෙනස්වීම් ආදි කරුණු කිහිපයක් නිසා ආරම්භක අවදියේ දී ආයතනය ප්‍රමාණවත් වේගයෙන් ගමන් කිරීමට අපොහොසත් විය. එම අපහසුකම් දැන් මඟ හැරී තිබේ. වර්ෂ දෙකක "ළදරු විය" ඉක්මවා ඇති ආයතනය, රටෙහි ආර්ථිකයට ඉතා වැදගත් වන කෘෂිකර්ම අංශයට උසස් සේවාවක් ඉටු කිරීමට සූදනමින් සිටී.

ලංකාවේ ගොවිජන ව්‍යුහය, වැවිලි අංශය හා ගොවි අංශය වශයෙන් බෙදිය හැකිය. විශාල ඉඩම්, අධික ධන ආයෝජන, කම්කරු සංවිධානය හා වැඩි නිෂ්පාදන වැවිලි අංශයේ කැපී පෙනෙන ලක්ෂණ වෙත්. වෙනත් අංශවල ආයෝජනය සඳහා විදේශීය විනිමය වැඩි කොටසක් ලැබෙන්නේ වැවිලි අංශයෙන් ය. ලෝක වෙළඳ පොළේ බඩු මිල පහත බැසීම නිසා මෑතක සිට වැවිලි අංශයට ද නව ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වී ඇත. මෑතක දී උද්ගත වූ මෙම තත්ත්වය නිසා නිසරු තේ හා රබර් ඉඩම්වල වෙනත් භෝග වැවීමේ අවශ්‍යතාවය මෙන්ම අඩුවෙන් මුදල් යොදවන සුළු ඉඩම් අංශයේ නිෂ්පාදිතය වැඩි කිරීමේ අවශ්‍යතාවය ද තදින්ම දැනී ඇත.

ආහාර භෝග වැවීමේ නිරතව සිටින සුළු ඉඩම් අංශය කෘෂිකාර්මික ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය ලෙස මට හැඟී යයි. රැකී රක්ෂා පුළුල් ලෙස උත්පාදනය කළ යුත්තේ ද මෙම අංශය මඟින් ය.

වැඩි ආදායම් අපේක්ෂා කරන. වැඩියෙන් රැකී රක්ෂාවලට අවස්ථා සපයන ගොවිතැන් ක්‍රමයක් බිහි කිරීමේ කාර්යභාරය සුළු ඉඩම් අංශය වෙත පැවරේ. මේ ක්‍රමයෙන් ඉදිරි වර්ෂ 5 හෝ 6 තුළ දී ආනයන ද්‍රව්‍ය සැලකිය යුතු අයුරින් කපා හරිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෘෂිකර්ම අංශයෙහි සුළු ගොවීන්ගේ සංවර්ධනයට බාධක වශයෙන් ඇත්තේ ශිල්පීය කරුණුවලට වඩා ආයතනික හා ව්‍යුහය සම්බන්ධ කරුණු බව පිළිගෙන ඇත. නවීන කර්මාන්ත හා පර්යේෂණවලින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේ ශිල්පීය ක්‍රම සොයා ගෙන ඇතත්, ඒවා පුළුල් ලෙස ගොවීන් අතර ව්‍යාප්ත වී නොමැත. එබැවින්, විටින් විට රජය මඟින් ආයතනික ප්‍රතිසංශෝධන ක්‍රියාත්මක කර ඇත. ඉන් සමහරක් සාර්ථක ප්‍රතිඵල ලබා දී ඇත. කෙසේ වෙතත්, ආයතනික ප්‍රතිසංශෝධන ස්ථිර පදනමක් නොමැතිව සීමිත දැනුම මත කරන තාවකාලික පිළියම් විය. මේ නිසා මෙම ආයතනික කරුණු ගැඹුරු ලෙස හැදෑරීමත්, සෑම තරාතිරකම අයවළුන් වෙත ඒ සම්බන්ධ පුහුණුවක් ලබාදීමත් අත්‍යවශ්‍යම ය.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට වැදගත් වැඩ කොටසක් ඉටු කිරීමට සිදු වන්නේ මෙතැන්හිදී ය. කෘෂිකර්ම අංශයට සම්බන්ධ වූ අත්‍යවශ්‍ය සාමාජීය හා ආයතනික කටයුතු පිළිබඳ විස්තර එක්රැස් කොට ප්‍රතිපත්ති සාධනයට උපකාරී වෙන අයුරින් හා තත්ත්වාකාරයෙන් එම කරුණු ඉදිරිපත් කිරීම ආයතනයට භාර කටයුත්තකි. භෝග වැවීම, සතුන් ඇති කිරීම පිළිබඳ ශිල්පීය ක්‍රමවලට වඩා ඉතා පුළුල් කාර්යයක් ඉටු කිරීමට ආයතනයට පැවරී ඇත. මුළු ගොවි ජීවන ක්‍රමය පවත්නා වූ ආහාර භෝග, ගව භෝග හා ගොවියා සහ වෙළඳපොළත්, සමාජයත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධය ගැඹුරින් වටහා ගැනීම ට ආයතනයේ අරමුණ වේ.

ගොවිජන අංශයෙහි සංවර්ධන ඇන හිටීමට හේතු වූ ව්‍යුහය සම්බන්ධ වූ මූලික කරුණක් නම් ඉඩම් භුක්ති ක්‍රමයයි. ප්‍රථමයෙන් කුඩා කාණ්ඩවලට බෙදී යන්නා වූ සුළු ඉඩම් පිළිබඳ ප්‍රශ්නය සඳහන් කළ හැකිය. කැබලිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් අයිතිය හා අඳ අයිතිය පිළිබඳ තරඟ වැඩිවන අතර එම ඉඩම්වලින් යැපෙන්නා වූ ගොවි ජනයාට ආයෝජන ශක්තිය හීනවීමත් ආදායම් මාර්ග හිඟවීමත්, රක්ෂා විරහිතවීමත් ආදී ප්‍රශ්න කිහිපයකට මුහුණ පෑමට සිදු වේ. දෙවනුව කැබලිවලට කැඩුනා වූ කුඩා ඉඩම් නිසා, විශේෂයෙන් පස හා වතු පාලනයට සම්බන්ධ වූ විවිධ ප්‍රශ්න උද්ගත වේ.

1958 වර්ෂයේ කුඹුරු පනතින් අඳ ගොවීන්ට අඳ අයිතිය තහවුරු කොට, ඉඩම් භුක්තිය පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීමට ප්‍රයත්නයක් දරන ලදී. එහෙත් ක්‍රියාත්මක කිරීමේ දී ඉෂ්ඨ ප්‍රතිඵල ලැබුණේ නැත. වර්තමානයේ පවත්නා ඉඩම් අයිතිය මූලික වශයෙන් වෙනස් වීමට ඉඩ තිබේ. මෙහිලා ගොවි කටයුතු පුහුණු කිරීමේ ආයතනයට වැදගත් කාර්යයක් පැවරේ. ඉඩම් නිරවුල් කිරීම, කෘෂිකාර්මික ණය හා අලෙවිය, සහතික මිල සහ පොදු වශයෙන් කෘෂිකර්මයෙහි සමාජ - ආර්ථික රටාව වර්තමාන සංවර්ධන අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රබල වෙනස්වීම්වලට භාජනය විය යුතුයි. මහවැලි සහ උඩවලවේ වැනි යෝජනා ක්‍රමවල ඇති වී ගෙන යන විශාල සංවර්ධන ක්‍රම නිසා මෙම අංශවලට පර්යේෂණ හා පුහුණු කිරීමේ වැඩකටයුතු තවත් වැදගත් වෙයි.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පර්යේෂණ කටයුතු මෙහෙයවීමේ දී රටෙහි ප්‍රශ්න තත්ත්වානුකූලව වටහාගෙන, ක්‍රියාත්මක විසඳුම් කෙරෙහි යොමු කෙරෙන කරුණු ඉස්මතු කළ යුතු වෙයි. ආකල්පයෙන් ද, ක්‍රියාවෙන් ද, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ක්‍රියාශීලී ආයතනයක් වන බව නො අනුමානය. සංවර්ධන වැඩ පිළිවෙලට සම්බන්ධ වූ සෑම කෙනෙක්ම ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රගතිය ගැන විමසිලිමත්ව හා බලාපොරොත්තු සහිතව බලා සිටින බව මට විශ්වාසයි. මෙම ආයතනයේ කටයුතු සාර්ථක වේවා"යි ප්‍රාර්ථනා කරමි.

**හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා**

*1972 පෙබරවාරි 21 දින දිය*